(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(8).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 සැප්තැම්බර් 28 බදාදා**

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 34/2022

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා,— 2019 නොවැම්බර් සිට මේ දක්වා රටේ ආර්ථිකයේ පසුබෑම පිළිබඳ සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— මෙරට ආර්ථිකය මේ වනවිට පෙර නොවූ විරූ දරුණු අර්බුදයකට ලක්ව ඇති බැවින් එම තත්ත්වයට වගකිවයුත්තන් පිළිබඳව විමර්ශනය කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය සතු පාර්ලිමේන්තුවේ වගකීම වන හෙයින් ද;

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 64 (2), 65 සහ 68 (1) වගන්ති යටතේ මුදල් මණ්ඩලය විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයා වෙත ලබාදිය යුතු ජීවන වියදම, උද්ධමනය, මුදල් සැපයුම සහ ජාත්‍යන්තර ගෙවුම් ශේෂය ඇතුළු ආර්ථික දර්ශක පිළිබඳ පුරෝකථන සහිත විශ්ලේෂණාත්මක වාර්තා ලබා නොදීමෙන් හෝ අමාත්‍ය මණ්ඩලය හෝ නිලධාරින් විසින් සිය වගකීම් පැහැර හැරීමෙන් මෙම ආර්ථික අපරාධය සැලසුම් සහගතව සිදු කළා ද යන්න පිළිබඳව විමර්ශනය කිරීම පාර්ලිමේන්තුවේ වගකීම වන හෙයින් ද; සහ

බදු සහන ලබා දීම, ණය වාරික නොගෙවා සිටීම, ආනයන සීමා පැනවීම, රුපියල සීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීමට ඉඩ සැලසීම, නිල සංක්‍රමණික ප්‍රේෂණ පහත වැටීම, රටේ උද්ධමනය අධි උද්ධමන තත්ත්වයක් දක්වා වැඩිවීම සහ ජීවන වියදම වැඩිවීම මෙරට ආර්ථික පරිහානියට හේතු වූ හෙයින් ද;

(අ) මෙතෙක් මුහුණ නොදුන් ආර්ථික අර්බුදයකට රට මුහුණ දීම, ඒ සම්බන්ධයෙන් අදාළ කාලසීමාවන්හි වගකීම් දරන ලද පුද්ගලයන් තම කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ද යන්නත්;

(ආ) ආර්ථික අර්බුදයේ බලපෑම වැළැක්වීමට සහ/හෝ අවම කිරීමට අදාළ බලධාරින් ප්‍රමාණවත් පියවර ගත්තේ ද යන්නත්;

(ඇ) ආර්ථික අර්බුදයේ බලපෑම වැළැක්වීමට සහ/හෝ අවම කිරීමට නොහැකි වීමට හේතු වූ රාජ්‍ය යාන්ත්‍රණයේ අඩුපාඩු තිබුණේ ද යන්නත්;

(ඈ) එවැනි ආර්ථික අර්බුදවලට මුහුණ දීමට දායක වූ වෙනත් කරුණු තිබේ ද යන්නත්;

(ඉ) අනාගතයේදී එවැනි ආර්ථික අර්බුදවලට රට පත් වීමට දායක වන්නා වූ වෙනත් කරුණු තිබේ ද යන්නත්; සහ

(ඊ) අනාගතයේදී එවැනි ආර්ථික පරිහානි අවම කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද යන්නත්

සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානයන් ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතුය.

3. එම කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

පා. 35/2022

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු මධුර විතානගේ මහතා,— දේශීය චිත්‍රපට කර්මාන්තය නගාසිටුවීම සඳහා ජාත්‍යන්තරව චිත්‍රපට නිෂ්පාදනය හා බෙදාහැරීම, සිනමා ශාලාවලට අමතරව වෙනත් ඩිජිටල් මාධ්‍යවල ප්‍රදර්ශනය සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— දේශීය චිත්‍රපට කර්මාන්තය මුහුණ දී සිටින තත්ත්වය නගාසිටුවීම සහ එහි ව්‍යාපාර මූලධර්මයන් යළි ස්ථාපනය කිරීම පිළිබඳව ප්‍රමුඛතා ලේඛනයක් සැකසීම, ප්‍රේක්ෂක ආකර්ෂණය 1971-1979 කාලය තුළ මෙන් යළි ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය වන හෙයින් ද;

සාම්ප්‍රදායික චිත්‍රපටකරණය වෙනුවට ඩිජිටල්කරණය ලබා ඇති ප්‍රගතිය අනුව දේශීය චිත්‍රපට නිෂ්පාදනය සහ පසු නිෂ්පාදන ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වන හෙයින් ද;

පාසල් අධ්‍යාපනය නිමකර සිනමා ක්ෂේත්‍රයට පිවිසීමට කැමැත්තක් හා දක්ෂතාවයක් දක්වන තරුණ පරපුරට පූර්ණ කාලීන රාජ්‍ය අනුග්‍රහය සහිත සිනමා පාසලක් බිහිකිරීම රාජ්‍ය ප්‍රතිපත්තියට ඇතුළත් කළ යුතු වන හෙයින් ද; සහ

වෛද්‍යවරුන්, හෙදියන්, නීතිඥයන්, ඉංජිනේරුවරුන් සහ වාස්තු විද්‍යාඥයන් බිහිකිරීම සඳහා විශ්වවිද්‍යාල ඇතත් සිනමා සහ රූපවාහිනී පූර්ණ කාලීනව හැදෑරීමට විශ්වවිද්‍යාල නොමැති හෙයින් ද,

ජාත්‍යන්තරව චිත්‍රපට නිෂ්පාදනය හා බෙදාහැරීම, සිනමා ශාලාවලට අමතරව නෙට්ෆ්ලික්ස් සහ ප්‍රයිම් වීඩියෝ ඇතුළු වෙනත් ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ඕවර්-ද-ටොප් මීඩියා සර්විස් වේදිකාවල (OTT Platforms) ප්‍රදර්ශනය සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද සහ එම සමාගම් සමඟ පූර්ව ගිවිසුම් ඇති කරගැනීම පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2.(අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානයන් ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතුය.

3. එම කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.